# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 320 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 22/02/2024 පැය 1435

## මාධ්‍ය නිවේදනය

**මලලගේ සුදත් කිත්සිරි නොහොත් ''වැලිවිට සුද්දා'' හෙරොයින් සමඟ අත්අඩංගුවට - කඩුවෙල පොලිස් ස්ථානය.**

2024.02.22 වන අද දින අළුයම් කාලයේදී ලද තොරතුරක් මත කඩුවෙල පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් මාලබේ පොලිස් වසමේ වැලිවිට ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 15 මිලි ග්‍රෑම් 300ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 47ක් වූ වැලිවිට ප්‍රදේශයේ පදිංචි මලලගේ සුදත් කිත්සිරි නොහොත් වැලිවිට සුද්දා නැමැත්තා වේ.**

මීට පෙර මෙම සැකකරු අයිස් මත්ද්‍රව්‍ය සන්තකයේ තබාගැනීම සම්බන්ධව අත්අඩංගුවට පත්ව ඇප මත නිදහස්ව සිටින අයෙකු වන අතර ඔහු සම්බන්ධයෙන් නීති විරෝධී වත්කම් හා විමර්ශන කොට්ඨාසය මගින් විමර්ශනයක් ආරම්භ කර තිබුණි. ඒ අතරතුර කඩුවෙල පොලිස් ස්ථානයට ලැබී තිබූ තොරතුරකට අනුව සැකකරු විසින් නීති විරෝධීව උපයාගත් දේපල බවට සැකකරන බස් රථ 05ක්, කාර් රථයක් සහ යතුරු පැදියක් පොලිස් භාරයට ගෙන වැඩිදුර විමර්ශනයක් ආරම්භ කරන ලදී. එම දේපල සම්බන්ධයෙන් ඇති නීතිමය ගැටළුවක් නිසා කඩුවෙල ගරු අධිකරණය මගින් තීන්දුවක් ලබා දෙමින් එම දේපල නැවත හිමිකරු වෙත මුදාහරින ලෙස නියෝගයක් ලබා දෙන ලදි.

2024.02.21 වන දින හෝමාගම ගරු මහාධිකරණය මගින් නැවත එම වත්කම් නීති විරෝධී වත්කම් හා විමර්ශන කොට්ඨාසය භාරයට ගෙන වැඩිදුර විමර්ශන සිදු කරන ලෙස නියෝග කරන ලදී. මෙම භාරයට ගන්නා ලද දේපල සැකකරු විසින් ඔහුගේ ඥාති සහෝදරියකගේ නමින් ලබාගෙන ඇති බවට විමර්ශන වලදී අනාවරණය වී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු සම්බන්ධයෙන් කඩුවෙල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**